# 2. ජාතික ආදායම සහ වියදම

## 2.1 සමස්ත උපනතීන්

2000 වසරේදී දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි) මූර්ත වශයෙන් සියයට 6.0 කින් වර්ධනය විය. මෙය 1999 වසරෙහි පැවති සියයට 4.3 ක වර්ධන අනුපාතයට සාපේක්ෂව සහ පසුගිය දශකයෙහි පැවති සියයට 5 ක් වූ සාමාන්‍ය වර්ධනයට සාපේක්ෂව ඉහළ වර්ධනයක් වෙයි. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම, 1999 වර්ෂයේ දෙවැනි භාගයේදී ආරම්භ වූ අතර 2000 වසරේදී අඛණ්ඩව වඩාත් වේගවත් ආකාරයෙන් ඉදිරියට ගියේය. නිමැවුම් කර්මාන්ත සහ සේවා අංශයන්හි යහපත් ක්‍රියාකාරීත්වය සීඝ්‍ර ආර්ථික වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. වෙළෙඳපොල මිල අනුව ද.දේ.නි. 1999 වසරේ පැවති බිලියන 1106 ට සාපේක්ෂව 2000 වසරේදී රුපියල් බිලියන 1256 ක් පමණ වීයැයි ඇස්තමේන්තු කර ඇත. සියයට 1.7 ක් වූ මැදි වසර ජනගහන වර්ධන අනුපාතිකයත් සමඟ, ඒක පුද්ගල ද.දේ.නි. 1999 වර්ෂයේදී රු. 58,077 (ඇ.එ.ජ.ඩො. 825) සිට 2000 වර්ෂයේදී රු 64,855 (ඇ.එ.ජ.ඩො 856) දක්වා ඉහළ ගියේය. ලෝක බැංකු වර්ගීකරණයට අනුව, ශ්‍රී ලංකාව අනුව දශකයේ අග භාගයේදී ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 795 - 3125 පරාසයට ඇතුළත් වන පහළ මධ්‍යම ආදායම් ලබන කාණ්ඩයේ රටක් ලෙස සැලකුණු අතර, එතැන් සිට අඛණ්ඩව එම ස්ථානය තවදුරටත් තහවුරු කර ගත්තේය. දළ ජාතික නිෂ්පාදනය (ද.ජා.නි.) වශයෙන් නිර්වචනය කරනු ලබන, විදේශයන්ගෙන් ලැබෙන ශුද්ධ සාධක ආදායමට ගලපන ලද දළ දේශීය නිෂ්පාදිතය, 2000 වර්ෂයේදී සියයට 5.8 කින් වර්ධනය විය. ආයෝජන ආදායම් වලින් ලැබූ ප්‍රතිලාභ අඩුවීම, විදේශ ණය සඳහා ඉහළ පොළී ගෙවීම් සහ ලාභ සහ ලාභාංශ වශයෙන් මුදල් පිටතට ගලායාම හේතුවෙන් වර්ෂය තුළ විදේශයන්ගෙන් ලැබෙන ශුද්ධ සාධක ආදායම පිරිහිණ.

2000 වර්ෂයේ පෙන්නුම් කරන ලද යහපත් වර්ධනය මූලික වශයෙන් ලෝක ආර්ථිකය සිය අවපාති තත්ත්වයෙන් මිදී ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ ප්‍රතිඵලයක් විය. 1999 දී වාර්තා වූ සියයට 3.4 වර්ධනයට සාපේක්ෂව 2000 වසරෙහිදී ලෝක නිෂ්පාදනය සියයට 4.7 කින් ප්‍රසාරණය විය. ඒ අනුව ලෝක වෙළඳාම 1999 වර්ෂයෙහි වූ සියයට 5.2 ට සාපේක්ෂව 2000 වර්ෂයේදී සියයට 12.5 කින් ඉහළ ගිය අතර සංවර්ධනය වන රටවල අපනයන වර්ධනය සියයට 9 ක් විය. ශ්‍රී ලංකා ආර්ථිකය, විශේෂයෙන්ම පෞද්ගලික අංශය, මෙම වර්ධනයන්ට සාධනීය ලෙස ප්‍රතිචාර දක්වීය. අපනයනාභිමුඛ කර්මාන්ත 1993 න් පසුව දක්වන ලද ඉහළම නිෂ්පාදන වර්ධනය හේතු කොට ගෙන නිමැවුම් කර්මාන්ත අංශය, ඉහළ වර්ධනයක් අත්කර ගත්තේය මේ අතර, ඉහළ යන ආනයන මිල තත්ත්වයක් යටතේ වුවද උද්ධමනය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවති අතර, විදේශ විනිමය වෙළෙඳපොළ වඩා නම්‍යශීලී වීම අපනයන තරඟකාරීත්වය වැඩිදියුණු කිරීමට හේතු විය.

ආර්ථික ක්‍රියාකාරීත්වය කෙරෙහි අයහපත් ලෙස බලපෑවැත් වූ කරුණු දෙකක් තිබියදීත් මෙම වර්ධන අනුපාතය ලඟා කර ගැනීම සුවිශේෂ වූවකි. ජාත්‍යන්තර වශයෙන් තෙල් මිල ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසරේ එ.ජ.ඩොලර් 500 ක්ව පැවති බොර තෙල් සහ ඛනිජ තෙල් සඳහා වූ වියදම එ.ජ.ඩොලර් 901 දක්වා ඉහළ යාම පළමු කාරණය ලෙස දක්විය හැකිය. අනෙක නම්, 2000 වසරෙහි මැද භාගයේ සිට යුද්ධය උත්සන්න තත්ත්වයකට පත්වීම හේතුවෙන් ආරක්ෂක වියදම් විශාල වශයෙන් ඉහළ යාමයි. මේ කාරණා හේතුකොටගෙන රාජ්‍ය අංශය දේශීය ප්‍රභවයන්ගෙන් ණය අවශ්‍යතා සපුරා ගැනීම හේතුවෙන් අරමුදල් පිරිවැය ඉහළ යන තත්ත්වයක් නිර්මාණය විය. තවද, තෙල් සඳහා වූ ඉහළ ආනයන මිල තත්ත්වයන් මත, වර්ෂය තුළ අවස්ථා කිහිපයකදී, ඛණිජ තෙල් නිෂ්පාදන කිහිපයක පාලන මිල ඉහළ දැමීම, නිෂ්පාදන පිරිවැය තවදුරටත් ඉහළ යාම කෙරෙහි බලපෑවේය.

2.1 රූප සටහන
ද.දේ.නි. වර්ධන අනුපාතිකය සහ ඒක පුද්ගල ද.දේ.නිෂ්පාදිතය
1991-2000
(1990 = 100)




කෙසේ වුවද, ආර්ථිකයෙහි නෛසර්ගික ශක්‍යතාවය සහ නිරන්තරයෙන් අනුගමනය කළා වූ දූරදර්ශී සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන්, ඉහත දක් වූ අහිතකර සංවර්ධනයන්හි ඍණාත්මක බලපෑම් මගහරවා වර්ෂය තුළ ඉහළ සංවර්ධන අනුපාතයක් ලඟා කර ගැනීමෙහිලා දායක විය. ආර්ථිකය ප්‍රසාරණය තුළින් ජනනය වූ බොහෝ ආර්ථික ක්‍රියාකාරීත්වයන් 1999 වර්ෂයේදී සියයට 8.9 ක් වූ විරැකියා අනුපාතය 2000 වර්ෂයේදී සියයට 7.7 දක්වා පහත හෙළීමට දායක විය. මේ අතර දළ දේශීය නිෂ්පාදිතයෙහි අවධමනය මගින් මනිනු ලබන සමස්ත මිල උද්ධමනය 1999 වර්ෂයට වඩා වැඩි වුවද සාපෙක්ෂ වශයෙන් සියට 6.7 ක් තරම් වූ පහත මට්ටමක විය. මීට හේතු සාධක ලෙස භාණ්ඩ හා සේවා සැපයුම වර්ධනය වීම සහ දූරදර්ශී මූල්‍ය කළමණාකරණය දක්විය හැකිය.

2000 වසරෙහිදී නිමැවුම් කර්මාන්ත අංශය සියයට 9 ක වර්ධනයක් පෙන්නුම් කළේය. කාර්මික අපනයනයන් සියයට 23 කින් ප්‍රසාරණය වෙමින් එ.ජ.ඩොලර් දශලක්ෂ 4200 ට වැඩි ප්‍රමාණයක් ඉපැයූ අතර එය, ඉහළ යමින් පවතින ආනයන සඳහා වූ ගෙවීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ගෙවුම් ශේෂ අපහසුතා යම් දුරකට සමනය කර ගැනීමට දායක විය. ගෝලීය ආර්ථික වර්ධනය, විශේෂයෙන්

එක්සත් ජනපදයෙහි ඇති වූ උත්පාත තත්ත්වයන් සහ බටහිර යුරෝපයේ ආර්ථික ප්‍රසාරණය හේතුවෙන් වර්ධනය වූ ඉල්ලුම, අපනයනාභිමුඛ කර්මාන්තයන් සඳහා වාසිදායක විය. නැගෙනහිර ආසියාතික රටවල ආර්ථිකයන් ප්‍රතිස්ථාපනය වීමත් සමඟ එම රටවල මුදල්වල අගය අධි ප්‍රමාණයවීම සහ ශ්‍රී ලංකා රුපියලෙහි අගය වේගයෙන් අව ප්‍රමාණයවීම, ශ්‍රී ලාංකික අපනයනකරුවනට සිය ජාත්‍යන්තර තරඟකාරීත්වය වර්ධනය කරගැනීමෙහිලා උපකාරී විය. දේශීය වශයෙන්, විදේශ විනිමය වෙළෙඳපොළ තුළ නම්‍යතාවය වැඩි දියුණු කරලීමට අවශ්‍ය පියවර ගනු ලැබිණි. මෙම ක්‍රියාදාමයන් ශ්‍රී ලංකා රුපියල සැලකියයුතු ලෙස අවප්‍රමාණ කිරීමෙහිලා බලපෑ අතර, එය වර්ෂය තුළදී අපනයන තරඟකාරීත්වය තවත් ඉහළ දැමීමට ආධාර විය. කෙසේ වුවද, ශ්‍රී ලාංකික කාර්මික අපනයනයන්ට බෙහෙවින්ම යැපෙන්නට සිදු වී ඇත්තේ ආනයනික යෙදවුම් විශාල වශයෙන් අඩංගු වන සහ වෙළෙඳපොළ තුළ ඉතා ඉහළ තරඟකාරීත්වයක් ඇති ඇඟළුම් අපනයනය මතය. මෙය අපනයන කර්මාන්ත දේශීය වශයෙන් ඉහළ එකතු කළ අගයෙන් යුතු කර්මාන්තයන් කරා තවදුරටත් විවිධාංගීකරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

මෑත වසරවල කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණය වූයේ කාර්යක්ෂමතාවය හා තරගකාරීත්වය වර්ධනය කිරීම පෙරදැරි කොටගෙන රාජ්‍ය සහභාගීත්වය ක්‍රමානුකූලව ඉවත් කර ගැනීමයි. මෙම ප්‍රතිපත්තිය වැවිලි කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ, විශේෂයෙන් තේ අංශය තුළ වඩාත් ප්‍රතිඵලදායී විය. 1995 දී ආරම්භ කරන ලද, රජයට අයත් ප්‍රාදේශීය වැවිලි සමාගම් පෞද්ගලීකරණය කිරීම තුළින් සහ පෞද්ගලික හිමිකම් සහිත කුඩා තේ වතු අංශයේ ව්‍යාප්තියත් සමගම මෙම අංශයෙහි කාර්යක්ෂමතාවය සැළකිය යුතු අන්දමින් වැඩිදියුණු විය. 1995 වසරෙහිදී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1302 ක් වූ සාමාන්‍ය තේ දළු ඵලදාව, 2000 වසරෙහි දී කිලෝග්‍රෑම් 1549 දක්වා ඉහළ ගිය අතර, තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 306 ක වාර්තාගත මට්ටමකට ළඟාවිය. පසුගිය වකවානුවේදී ශ්‍රී ලංකාවෙහි තේ වැවිලි අංශයෙහි ඵලදායීතාවය අනෙකුත් තරඟකාරී රටවලට වඩා සැළකිය යුතු පහළ මට්ටමක පැවතියද පෞද්ගලික කළමණාකාරීත්වය යටතේ මෙම අංශය අඛණ්ඩව වැඩි දියුණු වන බව මනාව පැහැදිලි වෙයි. කෙසේවුවද, අඩු මිල ආනයනික භාණ්ඩ හේතුකොටගෙන සමහර දේශීය කෘෂිකාර්මික අංශයන් හි ගොවීන්හට විශාල තරඟකාරීත්වයට මුහුණ දෙන්නට සිදුවූ අතර, මීට පිළියමක් ලෙස දේශීය නිෂ්පාදකයන් සඳහා අවම වෙළෙඳපොළ මිලක් ලැබෙන පරිදි ආරක්ෂණ ප්‍රතිපත්ති කිහිපයක් හඳුන්වා දීමට සිදුවිය. උදාහරණයක් වශයෙන් වී නිෂ්පාදන අංශය තුළ, අඩු ආනයන තීරු බදු යටතේ පසුගිය වසරේ ආනයන කිරීම මත එකතු වූ සහල් තොග හේතුවෙන් ගොවීන්ට සිය අස්වනු අලෙවි කර ගැනීමේ අපහසුතාවන්ට මුහුණපෑමට සිදුවීම ගෙනහැර දැක්විය හැකිය. මේ නිසා, සමූපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස.) හරහා වී මිලදී ගැනීම තුළින් සහ 2000 වසරේ ජූලි මස සිට සහල් ආනයනය තහනම් කිරීම තුළින්, රජය මෙම ප්‍රශ්නයට මැදිහත් විය. සහතික මිලක් පිරිනැමීමට අමතරව 2000 අගෝස්තු සිට ආනයන බද්ද මත සියයට 35 ක අධිභාරයක් පැනවීම තුළින් අර්තාපල් වගාව කෙරෙහිද රජයේ මැදිහත්වීම දක්නට හැකිය. මෙම මැදිහත්වීම අවාසනාවකට මෙන් මූලික ප්‍රතිපත්තීන් කෙරෙහි ප්‍රතිවිරෝධී සංඥ සැපයීමක් සිදු කළේය. කෙසේවුවද, විවිධ සහනාධාර ලබන අඩු පිරිවැය විදේශීය නිෂ්පාදනවලින් දේශීය කෘෂිකර්මාන්තය ආරක්ෂා කර ගත යුතු බවට අවධාරණය වී ඇත.

දළ දේශීය නිෂ්පාදනයෙහි වර්ධනයට විශාල වශයෙන් දායක වූයේ බලශක්ති, ප්‍රවාහන, සන්නිවේදන, වරාය සේවා, වෙළෙඳ කටයුතු සහ මූල්‍ය සේවාවන් ඇතුළත් වන සේවා අංශයෙහි ප්‍රසාරණයන් ය. මෙම අංශය, 1999 වර්ෂයෙහි වූ සියයට 51 ට සාපේක්ෂව 2000 වර්ෂයේදී සමස්ත වර්ධනයෙන් සියයට 61 ක දායකත්වයක් දැක්වීය. ලෝක ආර්ථිකයෙහි වර්ධනය තුළින් ප්‍රතිලාභ ලැබූ විදේශීය වෙළෙඳම 2000 වසරේදී සේවා අංශයෙහි වර්ධන ක්‍රියාකාරීත්වයට විශාල වශයෙන් දායක විය. යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා යොදන ලද ආයෝජනයන් ද සේවා අංශයෙහි වර්ධනය කෙරෙහි සාධනීය ලෙස බලපෑවේය. මෑත අතීතයේදී දුරකථන සංනිවේදන අංශයෙහි දක්නට හැකි වූ ප්‍රබල වර්ධන වේගය 2000 වසර තුළදීද අඛණ්ඩව සිදු විය. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, වර්ෂය තුළදී ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වන ජපන් බැංකුව, ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය, සහ කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල වැනි ආධාරකරුවන්ගේ සහයෝගය සහිතව එහි ධාරිතාව ඉහළ දැමීම සහ යටිතල පහසුකම් වර්ධනය කිරීම අරමුණු කොට ගෙන ප්‍රධාන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කළේය. 2000 වර්ෂය තුළදී බලශක්ති අංශය තුළ ලංකා විදුලිබල මණ්ඩලයෙහි (ලං.වි.ම.) සහ පෞද්ගලික අංශයෙහි ආයෝජන හේතුවෙන් සමස්ත ස්ථාපිත විදුලිබල ධාරිතාව තව දුරටත් ප්‍රසාරණය විය. මෙම ආයෝජනයන් අතුරින් පෞද්ගලික අංශය විසින් යාත්‍රාවක සවිකරන ලද මෙගාවොට් 60 ක බලයන්ත්‍රාගාරය සහ ලං.වි.ම. විසින් ස්ථාපනය කරන ලද මෙගාවොට් 40 ක දෙවැනි ඩීසල් විදුලි ජනක යන්ත්‍රය කැපී පෙනෙයි. මේ අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ද, ධාරිතා ප්‍රසාරණය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අදහසින්, යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කරන්නට යෙදුණි. ප්‍රධාන ව්‍යාපෘති අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වන ජපන් බැංකුව මගින් ආයෝජනය කරනු ලබන උතුරු පියර සංවර්ධන ව්‍යාපෘතියේ දෙවැනි අදියර සහ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (පෞද්ගලික) සමාගමට පවරා ඇති එළිසබෙත් රැජින ජැටිය ව්‍යාපෘතිය වරායෙහි ධාරිතාව පුළුල් කිරීම ඉලක්ක කොට ආරම්භ කෙරුණි. වරාය සේවාවන්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අදහසින් ලෝක බැංකුව වරාය කාර්යක්ෂමතාව දියුණු කිරීමේ ව්‍යාපෘතියකට ආධාර සැපයීය. නව ආයෝජනයන් ප්‍රවාහන අංශයෙහි වර්ධනය සඳහාද ප්‍රධාන විය. අළුතින් මිලදී ගත් දුම්රිය බලවේග කට්ටල ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සේවාවන් සහ ආදායම යන දෙකම ඉහළ දැමීමට සමත් විය. මේ අතර සංචාරකයින් ගේ පැමිණීම පහත වැටී තිබුණද ශ්‍රී ලංකන්

2.1 සංඛ්‍යා සටහන

**ස්ථාවර (1996) සාධක වියදම් මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය**

| | වැඩිවීමේ අනුපාතය % | | ද.දේ.නි.හි වැඩිවීමෙහි ප්‍රතිශතක දායකත්වය(%) | | ද.දේ.නි.හි ප්‍රතිශතය (%) | |
|---|---|---|---|---|---|---|
| | 1999(අ) | 2000(අ) | 1999 (අ) | 2000(අ) | 1999(අ) | 2000(අ) |
| **1. කෘෂිකර්මය, දව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය** | **4.5** | **1.8** | **22.2** | **9.2** | **21.3** | **20.5** |
| කෘෂිකර්මය | 4.4 | 1.7 | 16.7 | 4.6 | 16.6 | 15.9 |
| තේ | 1.3 | 7.8 | 0.4 | 1.8 | 1.4 | 1.4 |
| රබර් | 1.0 | -8.0 | 0.1 | -0.6 | 0.4 | 0.4 |
| පොල් | 9.1 | 8.0 | 3.5 | 2.3 | 1.7 | 1.8 |
| වී | 6.6 | -0.3 | 5.1 | -0.2 | 3.5 | 3.2 |
| අනෙකුත් | 3.4 | 0.8 | 7.6 | 1.3 | 9.6 | 9.1 |
| දව ආදී වන ද්‍රව්‍ය | 1.3 | 1.6 | 6.3 | 2.4 | 4.4 | 4.3 |
| ධීවර | 7.6 | 2.5 | 0.6 | 0.5 | 2.0 | 1.9 |
| **2. පතල් හා කැනීම් කටයුතු** | **4.1** | **4.8** | **1.7** | **1.4** | **1.8** | **1.7** |
| **3. නිමැවුම් කර්මාන්ත** | **4.4** | **9.2** | **17.3** | **25.9** | **16.9** | **17.4** |
| තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම | 3.8 | 4.2 | 1.9 | 1.5 | 2.1 | 2.1 |
| නිෂ්පාදන කර්මාන්ත | 4.5 | 10.4 | 14.0 | 23.2 | 13.5 | 14.0 |
| කුඩා කර්මාන්ත | 4.8 | 5.5 | 1.4 | 1.2 | 1.3 | 1.3 |
| **4. ඉදිකිරීම** | **4.8** | **4.8** | **7.8** | **5.6** | **7.1** | **7.0** |
| **5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා** | **9.5** | **4.5** | **3.1** | **1.1** | **1.5** | **1.5** |
| **6. ප්‍රවාහනය, ගබඩා කිරීම හා සංනිවේදනය** | **8.1** | **7.8** | **20.9** | **14.9** | **11.6** | **11.8** |
| **7. තොග සහ සිල්ලර වෙළෙඳම** | **1.0** | **8.7** | **5.0** | **31.2** | **21.5** | **22.1** |
| ආනයනය | -1.4 | 12.9 | -3.2 | 20.0 | 9.3 | 10.0 |
| අපනයනය | 6.1 | 18.3 | 3.3 | 7.3 | 2.4 | 2.7 |
| දේශීය | 2.1 | 2.4 | 4.9 | 3.9 | 9.8 | 9.5 |
| **8. බැංකු රක්ෂණ සහ නිශ්චල දේපල** | **4.6** | **6.4** | **8.0** | **8.0** | **7.5** | **7.6** |
| **9. නිවාස අයිතිය** | **1.2** | **1.6** | **0.5** | **0.5** | **1.8** | **1.8** |
| **10. රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු** | **4.2** | **4.2** | **4.8** | **3.4** | **4.9** | **4.8** |
| **11. සේවා (අන් තැනක සඳහන් නොවන)** | **9.8** | **2.3** | **8.9** | **1.6** | **4.1** | **4.0** |
| **12. දළ දේශීය නිෂ්පාදිතය** | **4.3** | **6.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

එයාර් ලයින්ස් සමාගමට අළුතින් යාත්‍රා මිලදී ගැනීම තුළින් එහි සේවා පුළුල් කිරීමට හැකි විය. මෙවැනි වැදගත් අංශයන් තුළ ඉහළ ආයෝජනයන් යෙදවීම තුළින් මූලික හා ද්විතීයික අංශයන්හි ඵලදායීතාව ඉහළයාමත් දක්නට හැකි විය.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 351 කට ඇස්තමේන්තු කර ඇති අතර එය, 1999 ට වඩා සියයට 16 ක වර්ධනයකි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි වර්ධනය, ප්‍රධාන වශයෙන් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන්හි ආයෝජනයන් ඉහළයාමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූවකි. මේ අනුව, දළ දේශීය නිෂ්පාදනයෙහි අනුපාතයක් වශයෙන් දක්වෙන සමස්ත ආයෝජනය 1999 දී තිබූ සියයට 27 සිට සියයට 28 දක්වා ඉහළ ගොස් ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙම වර්ධනය හුදෙක්ම, සියයට 21 සිට සියයට 22 දක්වා ඉහළ නැංවුනු පෞද්ගලික අංශයේ ආයෝජනය ඉහළයාම තුළින් ඇතිවිය. රාජ්‍ය අංශයේ ආයෝජනයන් සියයට 6.7 සිට සියයට 6.6 දක්වා ආන්තික වශයෙන් පහත වැටුණි.

## 2.2 ආංශික ක්‍රියාකාරිත්වය

2000 වසරේදී එකතු කළ අගය මූර්ත වශයෙන්, නිමැවුම් කර්මාන්ත (සියයට 9), සේවා (සියයට 7), ඉදිකිරීම් (සියයට 5), පතල් සහ කැනීම් (සියයට 5) සහ කෘෂිකර්මාන්ත (සියයට 2) වශයෙන් වර්ධනය විය. සමස්ත සේවා අංශය, දළ දේශීය නිෂ්පාදිතයෙහි මුළු වර්ධනයෙන් සියයට 61 ට දායක විය. සේවා අංශයෙහි ඉහළ දායකත්වය ලැබුණේ තොග සහ සිල්ලර වෙළඳම් අංශය තුළිනි. 1999 දී සමස්ත වර්ධනයෙන් සියයට 17 කට දායක වූ නිමැවුම් කර්මාන්ත අංශය, 2000 වසරේ සමස්ත වර්ධනයෙන් සියයට 26 කට දායක විය. මීට අමතරව, සමස්ත වර්ධනය කෙරෙහි කෘෂිකර්මාන්තය (සියයට 6 කින්), ඉදිකිරීම් (සියයට 6

කින්) සහ පතල් සහ කැනීම් (සියයට 1 කින් ) යන අංශයන් දයක විය.

## නිමැවුම් කර්මාන්ත අංශය

1999 වර්ෂයෙහිදී සියයට 4.4 කින් වර්ධනය වූ කර්මාන්ත අංශය 2000 වසරෙහි දී සියයට 9.2 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. අපනයනාභිමුඛ කර්මාන්තයන් අතර විශාලතම උප අංශය වන රෙදිපිළි සහ ඇඟළුම් අංශය, සියයට 16 ක වර්ධනයක් වාර්තා කළේය. 1999 දී මෙම අංශයෙහි වර්ධන අනුපාතය සියයට 7.5 ක් විය. 2000 වසරේදී යහපත් ලෙස ක්‍රියාත්මක වූ අනෙකුත් අපනයනාභිමුඛ කර්මාන්තයන් නම් රබර් නිෂ්පාදන, දියමන්ති සැකසීම සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන්ය. තොරතුරු තාක්ෂණය වැඩිදියුණු කිරීම සහ නිෂ්පාදන කටයුතු සඳහා වැඩිදියුණු කළ තාක්ෂණය භාවිතය ද කර්මාන්ත නිෂ්පාදනයෙහි එකතු කළ අගය ඉහළ නැංවීමෙහිලා දයක විය. වේගවත්, තොරතුරු බහුල සහ ලාභදයී වන්නා වූ අන්තර්ජාලය හරහා නව වෙළඳපොළවල් හා නව විලාසිතා පිළිබඳ තොරතුරු කරා ළඟා වීමට දේශීය නිෂ්පාදකයනට හැකිවිය. උසස් තාක්ෂණික වැඩසටහන යටතේ ප්‍රදනය කෙරුණු මූල්‍යමය දිරිගැන්වීම් මගින් නව නිෂ්පාදන තාක්ෂණයන්හි ආයෝජනයන් කිරීමටත් නිෂ්පාදන වියදම අවම කරගැනීමට සහ නිෂ්පාදන තත්ත්වයන් උසස් තලයකට ගැනීමටත් නිෂ්පාදකයන් පෙළඹවීය. සමස්ත ආර්ථික අභිවෘද්ධිය දේශීය පාරිභෝගිකයන් සඳහා නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ සඳහාද වෙළෙඳපොළක් නිර්මාණය කළේය. 1999 වර්ෂයේ දී සියයට 2.2 කින් වර්ධනය වූ, ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදනය, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සියයට 5 කින් ප්‍රසාරණය විය. මෙම වර්ගීකරණයෙහි ආහාර සහ පාන වර්ග උප වර්ගීකරණය සැලකිය යුතු වර්ධනයක් පෙන්වීය. කෙසේ වුවද, ඉහළ දමූ බදු හේතුවෙන් මත්පැන් සහ දුම්කොළ උප වර්ගීකරණයෙහි ක්‍රියාකාරිත්වය, පහත මට්ටමක පැවතිණි.

තේ, රබර් සහ පොල්මද නිෂ්පාදන සැකසුම් කර්මාන්ත වර්ෂය තුළ සියයට 4.2 කින් වර්ධනය විය. මෙය, මූලික වශයෙන් තේ සහ පොල් නිෂ්පාදනයන්හි වැඩිදියුණු වීම හේතුවෙන් සිදුවිය. මේ අතර, කුඩා කර්මාන්තයන්ද සියයට 5.5 කින් වර්ධනය විය. විශාල පරිමාණ කර්මාන්තවල ප්‍රසාරණය නිරතුරුවම උප කොන්ත්‍රාත් සහ බාහිර සම්පාදන (Outsourcing) ස්වරූපයෙන් කුඩා ප්‍රමාණයේ කර්මාන්ත කෙරෙහි ධනාත්මක ලෙස බලපානු ලබයි. කුඩා කර්මාන්ත ගණය තුළ පරිගණක සහ සන්නිවේදන උපකරණ එකලස් කිරීම, ලුහු ඉංජිනේරු, වාහන නඩත්තුව සහ වායු සමීකරණ කටයුතු ශීඝ්‍ර වේගයකින් වර්ධනය විය. එසේ වුවද, වර්ෂයේ පසු අර්ධයෙහිදී ඉන්ධන මිල සහ පොළී අනුපාත ඉහළ දමීම හේතුවෙන් සමහර සුළු කර්මාන්ත අපහසුතාවන්ට මුහුණ පෑවේය.

## සේවා අංශය

2000 දී දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය කෙරෙහි ඉහළම දයකත්වය සැපයුවේ, තොග හා සිල්ලර අංශයයි. මෙය එකතු කළ අගය ස්වරූපයෙන්, ගත් කල, ආර්ථිකයෙහි විශාලම උප අංශය වේ. මෙම වර්ධනය කෙරෙහි පූර්ණ වශයෙන් හේතුවූයේ විදේශ වෙළඳම වර්ධනය වීමයි. පසුගිය වසරේ සියයට 6 කින් වර්ධනය වූ අපනයන වෙළඳ උප අංශය 2000 වසරේ සියයට 18 කින් වර්ධනය විය. මෙම උප අංශයෙහි, සියයට 23 ක් වූ ඉහළම වර්ධනය අත්කර ගත්තේ කාර්මික අපනයනයන්ය. ඉකුත් වසරේ පසුබෑමකට ලක් වූ ආනයන වෙළඳ උප අංශය 2000 වසරේදී සියයට 13 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම කාණ්ඩය තුළ පාරිභෝගික භාණ්ඩ ආනයනය ප්‍රමාණාත්මක වශයෙන් සියයට 20 කින් ඉහළ ගිය අතර අතරමැදි හා ආයෝජන භාණ්ඩ ආනයනය පිළිවෙලින් සියයට 11 සහ සියයට 12 බැගින් වර්ධනය විය. දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ අලෙවියෙහි එකතු කළ අගය ගණනය කරනු ලබන දේශීය වෙළඳ උප අංශයෙහි වර්ධනය සියයට 2.4 ක් විය.

මෑත වසර වලදී දක්නට හැකි වූ වර්ධන වේගය තවදුරටත් පවත්වා ගනිමින්, ප්‍රවාහන, ගබඩා කිරීම් සහ සන්නිවේදන අංශයෙහි එකතු කළ අගය සියයට 7.8 කින් ඉහළ ගියේය. 1996 සිට ශීඝ්‍රයෙන් සහ අඛණ්ඩව වර්ධනය වූ දුරකථන සන්නිවේදන උප අංශය, වර්ධනය කෙරෙහි තවදුරටත් ඉහළ දයකත්වයක් සපයමින් පසුගිය වසර තුළදී සියයට 31 කින් ප්‍රසාරණය විය.

මෑත වසරවලදී පෞද්ගලීකරණය කිරීම හා ලිහිල්කරණය කිරීම තුළින් ප්‍රතිලාභ ලැබූ දුරකථන සන්නිවේදන කර්මාන්තය 2000 වසරේදී ද අඛණ්ඩව වර්ධනය විය. 1996 ට පෙර මුළුමනින්ම රාජ්‍ය ඒකාධිකාරයකට යටත්ව පැවති මෙම කර්මාන්තයට, එන්.එන්.ටී, ටෙලියා, ටෙලිස්ට්‍රා, ජී.ටී.ඊ. නෝර්ටෙල්, හචින්සන් සහ මැලේසියා ටෙලිකොම් වැනි ගෝලීය වෙළඳපොළෙහි දවැන්තයන්ගේ ආගමනයත් සමග එහි ව්‍යුහයෙහි තීරණාත්මක වෙනසක් දක්නට හැකිවිය. පසුගිය වසරේ ශ්‍රී ලංකා ටෙලිකොම් සහ පෞද්ගලික අංශය යටතේ වූ දුරකථන ග්‍රාහකයන්ගේ සංඛ්‍යාව සැලකියයුතු ලෙස වර්ධනය විය. ශ්‍රී ලංකා ටෙලිකොම් කෙරෙහි වූ ප්‍රබල තරගකාරීත්වය එහි සේවා තත්ත්වයන් උසස් කිරීමට දයක වූ අතර, උදහරණයක් ලෙස, වර්ෂය තුළ, ශ්‍රී ලංකා ටෙලිකොම්හි පාරිභෝගික පදනමෙහි අර්ධයක්ම ආවරණය වන මහ කොළඹ ප්‍රදේශය තුළ "ශූන්‍ය දෝෂ" (Zero fault) ඉලක්කය කරා ළඟා වීමට හැකිවීම දක්විය හැකිය. ශ්‍රී ලංකා ටෙලිකොම් සපයනු ලබන දුරකථන සඳහා මහ කොළඹ ප්‍රදේශය තුළ පොරොත්තු ලැයිස්තුවෙහි පහත වැටීමක් පෙන්නුම් කළද, ග්‍රාමීය අංශය තුළ නව දුරකථන සබඳතා සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම හේතුවෙන් සියයට 5 කින් ඉහළ ගියේය. මෙසේ වැඩිවෙමින් පවතින ඉල්ලුම සමනය කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වර්තමානයෙහි ප්‍රධාන දුරකථන සන්නිවේදන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරමින් සිටී.

2000 වසරේදී පෞද්ගලික අංශය වෙතින් සපයනු ලැබූ දුරකථන සංඛ්‍යාව සියයට 25 කින් ඉහළ ගිය අතර දුරකථන සන්නිවේදනයෙහි නව ආරක් පිළිබිඹු කරමින් සෙලියුලර් දුරකථන සැපයුම සියයට 75 ක වර්ධනයක් සටහන් කළේය. විශාල ආයෝජනයන්, ආකර්ශනීය ප්‍රචාරක ව්‍යාපාර, නවීන පහසුකම් හඳුන්වාදීම සහ තරගකාරී මිල මෙම වර්ධනයෙහිලා දයක විය. මේ හා සමගම, අන්තර් ජාල හා විද්‍යුත් තැපැල් භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාවද සියයට 59 කින් ඉහළ ගියේය. මේ අනුව, දුරකථන සන්නිවේදන අංශයෙහි වර්ධන වේගය මැත අනාගතය තුළ නොකඩවා පවත්වා ගෙන යනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය.

වරාය සේවා, 1998 සිට අඛණ්ඩව සිදු වූ මන්දගාමී වර්ධනය පිළිබිඹු කරමින් සියයට 0.4 කින් ආන්තික වශයෙන් වර්ධනය විය. 2000 වසරේදී ලෝක වෙළඳ කටයුතු ප්‍රසාරණය වෙමින් තිබියදීත් වරාය සේවාවන්හි මන්දගාමී වර්ධනයක් පැවතීම අවධානයට ලක් විය යුතු කරුණකි. 2000 වසර තුළදී ප්‍රතිනැව්ගත කිරීම් සියයට 2 කින් පහත වැටුණු අතර සාපේක්ෂ වශයෙන් අඩු ඵලදායිතාවය හා මෙම කලාපය තුළ අළුතින් ඇතිවූ වරායන් වෙතින් ඇතිවූ දැඩි තරගකාරිත්වය හේතුවිය. කෙසේවුවද, දේශීය නැව්භාණ්ඩ හැසිරවීමේ පරිමාව සියයට 8 කින් ඉහළයාම විදේශීය වෙළඳ ක්‍රියාකාරකම් ප්‍රසාරණයවීම පිළිබිඹු කළේය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, පී.එස්.ඒ සමාගම (සිංගප්පූරුව), ඩුබායි වරාය අධිකාරිය සහ ඉන්දියාවෙහි හා මැදපෙරදිග අළුතින් බිහිවෙමින් පවතින කේන්ද්‍රීය වරායයන් වැනි වරායයන්ගෙන් මතුවෙමින් පවතින තරගකාරිත්වයට මුහුණදීමට හැකිවන පරිදි, ඵලදායිතාවය ඉහළ නැංවීමට හා වරාය පහසුකම් ප්‍රසාරණය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කෙරමින් පවතී. "පී.ඇන්ඩ් ඕ." වැනි බහු ක්‍රියාකරුවකු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආයෝජන කටයුතු වලට සම්බන්ධවීම නැව් සමාගම්වල විශ්වාසය ඉහළ නැංවීමට සමත් වූ අතර, කලාපය තුළ මතුවෙමින් පවතින තරගකාරිත්වයට මුහුණදීමට කොළඹ වරායට අවස්ථාව සලසා දුන්නේය.

මගී සහ භාණ්ඩ ප්‍රවාහනය ඇතුලත් වන ප්‍රවාහන උප අංශය, මහා මාර්ග, දුම්රිය සහ ගුවන් යන වර්ගීකරණයට යටත් වෙයි. මෙම අංශයන්හි ඒකාබද්ධ වර්ධන අනුපාතය 2000 වසරේදී සියයට 4 ක් වූ අතර, මීට සාපේක්ෂව 1999 දී එය සියයට 2.9 ක් විය. දේශීය නිෂ්පාදනය ඉහළයාම මෙන්ම විදේශ වෙළඳාමෙහි වර්ධනයට සමගාමීව භාණ්ඩ ප්‍රවාහනයෙහි වර්ධනය සිදුවිය. මෑත වසරවල පොදු මගී ප්‍රවාහනයට හඳුන්වා දුන් සුඛෝපභෝගී සහ අර්ධ සුඛෝපභෝගී බස් සේවාව, මගී ප්‍රවාහන අංශයෙහි එකතුකළ අගය ඉහළ නැංවීමට සමත් විය. ශ්‍රී ලංකා දුම්රිය සේවාව බලවේග කට්ටල 15 ක් මිලදීගත් අතර, මේ තුළින් මගී ප්‍රවාහනයෙන් ලැබෙන මුළු ආදයම ඉහළ යාමත් එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවාහන අංශයෙහි එකතු කළ අගය වර්ධනය වීමත් දක්නට හැකිවිය. අළුතින් ගුවන්යානා මිලදී ගැනීමෙන් පසු ශ්‍රී ලංකන් එයාලයින්ස් මගින් පියාසර කරන ලද මගී කිලෝමීටර් ගණන 1999 දී වූ දශලක්ෂ 5,185 සිට 2000 වර්ෂයේදී දශලක්ෂ 6,859 දක්වා ඉහළ ගියේය.

බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල අංශයේ 1999 දී දක්නට ලැබුනු සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව 2000 වසරේදී සියයට 6.4 කින් වර්ධනය විය. විදේශ වෙළඳ කටයුතුවල වර්ධනය, වාණිජ බැංකුවල ලාභදායිත්වය ඉහළ නැංවූ අතර, 2000 වසරේ අගෝස්තු මාසයේදී විදේශ මුදල් තැන්පතු මත ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඉවත් කිරීම, බැංකුවල අරමුදල් පිරිවැය අවම කිරීමට හේතුවිය. රක්ෂණ උප අංශය වර්ෂය තුළදී යහපත් ලෙස ක්‍රියාකාරී වූ නමුදු වර්ෂයේ දෙවැනි භාගයේදී පොළී අනුපාත ඉහළ යාම හේතුවෙන් කල්බදු කටයුතුවල අයහපත් තත්ත්වයන් දිස්විය.

1999 වසරේ වූ සියයට 9.5 ක වර්ධනයට සාපේක්ෂව, විදුලිබල, ගෑස් සහ ජල අංශය 2000 වසරේදී සියයට 4.5 කින් වර්ධනය විය. වර්ෂය තුළදී විදුලිබලය සඳහා ඉල්ලුම සියයට 9 කින් ඉහළයාම කෙරෙහි ප්‍රධාන වශයෙන් නිමැවුම් කර්මාන්ත හා සේවා අංශයන්හි ඉහළ වර්ධනය සහ ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම හේතුවිය. මෙම තත්ත්වයට සාර්ථකව මුහුණදීම සඳහා විදුලි ජනනය සියයට 10 කින් ඉහළ නංවනු ලැබීය. ජලාශ පෝෂක ප්‍රදේශවලට වර්ෂාව නොලැබීම හේතුවෙන්, වර්ෂය පුරාම අඛණ්ඩව විදුලිබලය සැපයීම සඳහා විදුලිබල මණ්ඩලයට සිය තාප විදුලි ජනක යන්ත්‍ර හා පෞද්ගලික අංශයේ තාප විදුලි ජනක යන්ත්‍ර සේම කුලී පදනමෙන් ලබාගත් විදුලි ජනක යන්ත්‍රද භාවිතයට ගැනීමට සිදුවිය. මේ අනුව විදුලිබල අවශ්‍යතාවයෙන් සියයට 52 ක් තාප බලයෙන් ලබාගත් අතර මීට සාපේක්ෂව පසුගිය වසරේ මෙම සංඛ්‍යාව සියයට 31 ක් විය. මේ නිසා විදුලි ජනන අතරමැදි යෙදවුම් පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය, ලෝක බනිජ තෙල් මිල ඉහළයාම නිසා තාප විදුලි ජනක පිරිවැය ඉහළයාමේ ප්‍රතිඵලයක් විය. මේ අනුව විදුලිබල උප අංශයෙහි එකතු කළ අගය, 1999 දී සියයට 8.9 ඉහළ ගිය නමුදු 2000 වර්ෂයේදී ආංශික වර්ධනය සියයට 4.5 ක් ලෙස සටහන් කරමින් මන්දගාමී ස්වරූපයක් පෙන්වීය. මේ අතර රැස්කිරීම, පිරිසිදු කිරීම සහ බෙදහැරීම ඇතුළත්වන ජල උප අංශය වර්ෂය තුළදී සියයට 4.5 කින් ඉහළ ගියේය. 1999 දී මීට සමගාමී වර්ධන අනුපාතය සියයට 13.7 ක් විය. මෝසම් වැසි නොලැබීමට පසුගාමීව ඇතිවූ ජල සැපයුම අඩාලවීම හේතුවෙන් විශාල පරිමාණ ජල බෙදහැරීම සියයට 8 කින් පහත වැටුණි.

රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක අංශය සියයට 4.2 කින් වර්ධනය විය. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය මෙම අනුපාතයෙන්ම ප්‍රසාරණය වූ අතර විශේෂයෙන් ප්‍රාදේශීය පරිපාලනය, ආරක්ෂක සේවා පුද්ගලයන් සහ සමෘද්ධි සේවකයන් යන කොට්ඨාශ ඊට අයත්ය. මේ අතර හිමිකරු පදිංචිව සිටින්නා වූ නිවාස මගින් ජනනය කරනු ලබන සේවාවෙහි එකතු කළ අගය ගණනය කරන නිවාස හිමිකම් අංශය සියයට 1.7 කින් වර්ධනය වූ අතර, සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට එම අංශයේ දයකත්වය සියයට 1.8 ක් විය. ප්‍රධාන "සේවා" අංශය තුළ වර්ගීකරණය නොකරන ලද "අනෙකුත්" සේවා අංශය, 1999 සියයට 9.8 ක් වූ වර්ධනයට සාපේක්ෂව 2000 වසර තුළදී සියයට 2.3 කින් වර්ධනය විය. මෙම අංශයෙහි මන්දගාමිත්වයට,

සංචාරකයන්ගේ පැමිණීම පහත වැටීම හේතුවෙන් හෝටල සහ ආශ්‍රිත සේවා උප අංශයෙහි සටහන් වූ සෘණාත්මක වර්ධනය ප්‍රධාන වශයෙන් හේතුවිය.

ප්‍රධාන වශයෙන් විදේශ සංචාරකයන්ගේ පැමිණීම මත රඳා පවතින හෝටල් සේවා 2000 වසරෙහිදී සියයට 6.1 කින් පහත වැටුණේය. වර්ෂය තුළ සංචාරකයන්ගේ පැමිණීම පසුගිය වසරට සාපේක්ෂව සියයට 8 කින්, 400,414 දක්වා පහත වැටුණේය. කෙසේ වුවද සංචාරකයන් දිගුකලක් නැවතී සිටීම සනිටුහන් කරමින් ශ්‍රේණිගත කරන ලද හෝටලවල විදේශීය අමුත්තන් ගත කළ රාත්‍රි ගණන සියයට 2.2 කින් ඉහළ ගියේය. මේ අතර දේශීය සංචාරක කර්මාන්තයෙහි ක්‍රියාකාරිත්වය යහපත් වූ බව සනිටුහන් කරමින්, ශ්‍රේණිගත කරන ලද හෝටල්වල ලැගුම් ගත් දේශීය අමුත්තන් ගත කළ රාත්‍රි ගණන වර්ෂය තුළ සියයට 15 කින් වර්ධනය විය. රජයේ රෝහල්වල පවතින සීමිත පහසුකම්, ජනතාවගේ ආදායම් තත්වය ඉහළයාම, සහ නාගරීකරණය හේතුවෙන් පෞද්ගලික සෞඛ්‍ය සේවා උප අංශය 2000 වසරෙහිදී සියයට 10 කින් වර්ධනය විය.

ආරක්ෂක සහ පවිත්‍රතා වැනි සේවා සඳහා බාහිර සම්පාදන (out sourcing) උපයෝගී කර ගැනීමේ ප්‍රවනතාවය මෙවැනි ක්‍රියාකාරකම්වලට ඉහළ ඉල්ලුමක් නිර්මාණය කළ අතර, 2000 වර්ෂය තුළ එවැනි සේවාවන්ගේ වර්ධනය සියයට 10 ක් විය. විශාල ඉල්ලුමක් පවතින සහ තවදුරටත් ප්‍රසාරණය වීමේ ශක්‍යතාවය ඇති පරිගණක මෘදුකාංග සංවර්ධනය හා දත්ත ආශ්‍රිත සේවා සියයට 16 ක යහපත් වර්ධනයක් වාර්තා කළේය.

## ඉදිකිරීම් අංශය

නේවාසික හා වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම සහ යටිතල පහසුකම් සම්පාදනය අඩංගුවන ඉදිකිරීම් අංශය, 1999 දී මෙන්ම 2000 වර්ෂය තුළදී ද සියයට 4.8 කින් වර්ධනය විය. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් බලශක්ති, දූරකථන සන්නිවේදන, ප්‍රවාහන යන අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යෙදවූ ආයෝජනයන් වැඩිකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය. කෙසේ වුවද, ගොඩනැගිලි ඉදිකිරීම්වල වර්ධනය, පසුගිය වසරට වඩා මන්දගාමී ස්වරූපයක් පෙන්විය. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කෙරුණු රාජ්‍ය අංශයේ නිවාස වැඩ පිළිවෙල ආරම්භ කරන ලද සහ නිමා කරන ලද නිවාස සංඛ්‍යාව මෙන්ම නිවාස ඉදිකිරීම් සඳහා ප්‍රදානය කරන ලද ණය වශයෙන්ද ගත් කල සැලකියයුතු පහත වැටීමක් පෙන්නුම් කරයි. නිවාස සහ දේපල සංවර්ධන ව්‍යාපෘති සඳහා වාණිජ බැංකු මගින් සපයන ලද ණය පහසුකම් පහත වැටීම මගින් පෙන්වන පරිදි පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතුද වර්ෂය තුළදී මන්දගාමිත්වයට පත්විය.

## පතල් හා කැනීම් අංශය

පසුගිය වසරේදී සියයට 4.1 කින් වර්ධනය වූ පතල් සහ කැනීම් අංශය 2000 වසරේදී සියයට 4.8 කින් වර්ධනය විය. මැණික් පතල් කර්මාන්තය පසුගිය වසරට වඩා සියයට 10 කින් පහත වැටුණද, අපනයන මිල තියුණු ලෙස ඉහළ යාම නිසා මැණික් අපනයනයන් මගින් ඉපැයූ ආදායම සියයට 64 කින් ඉහළ ගියේය. මේ අතර, පොස්පේට් සහ මිනිරන් නිෂ්පාදනය ඉහළ ගිය නමුත් ඩොලමයිට්, රූටයිල් සහ ක්‍රූඩ් සර්කෝන් (Crude Zircon) වැනි ඛනිජ වැලි නිෂ්පාදනය, පහත මට්ටමක පැවතුණි. ඉදිකිරීම් කටයුතුවල අඛණ්ඩ ප්‍රසාරණයත් සමග වැලි, කලුගල්, හුණු සහ ගඩොල් සහ සෙවිලි උළු සඳහා අවශ්‍ය මැටි වැනි ප්‍රධාන කැණීම් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම හේතුවෙන් කැණීම් උප අංශය සියයට 5 කින් වර්ධනය විය.

**2.2 සංඛ්‍යා සටහන**

**අනෙකුත් කෘෂිකාර්මික උප අංශයේ සංයුතිය**

| අංශය | 1996 ස්ථාවර මිල අනුව එකතු කළ වටිනාකම (රු.දශලක්ෂ) | | |
|---|---|---|---|
| | 1998(අ) | 1999(අ) | 2000(අ) |
| එළවළු | 33,126 | 35,235 | 36,426 |
| අතුරු ආහාර භෝග (ආ) | 15,577 | 15,781 | 16,032 |
| සුළු අපනයන භෝග (ඇ) | 7,825 | 7,666 | 6,960 |
| උක්ගස් | 1,202 | 1,281 | 1,345 |
| දුම්කොළ | 1,569 | 1,484 | 1,325 |
| සත්ව පාලනය (ඈ) | 6,560 | 6,597 | 6,630 |
| අනෙකුත් | 8,837 | 9,192 | 9,136 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) අතුරු ආහාර භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් අර්තාපල්, මිරිස්, රතුළූණු, ලොකුළූණු, මුංඇට, කව්පි, කුරක්කන් ඇතුළු අනෙකුත් අතුරු ආහාර භෝග වලින් සමන්විත වේ.
(ඇ) සුළු අපනයන භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් කෝපි, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, කජු, බුලත් හා අනෙකුත් සුළු අපනයන භෝග වලින් සමන්විත වේ.
(ඈ) සත්ව පාලන කාණ්ඩය ප්‍රධාන වශයෙන් කිරි, බිත්තර, කුකුල් මස් හා අනෙකුත් මස් නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගයන්ගෙන් සමන්විත වේ.

## කෘෂිකාර්මික අංශය

1999 වර්ෂයේදී සියයට 4.5 කින් වර්ධනය වූ සමස්ත කෘෂිකාර්මික අංශය 2000 වසරේදී සියයට 1.8 කින් මන්දගාමී ලෙස වර්ධනය විය. මෙම මන්දගාමී වර්ධනයට, මූලික වශයෙන් සමහර උප අංශයන්හි අසතුටුදායක ක්‍රියාකාරිත්වයන් හේතුවිය. කෙසේ වුවද, වැවිලි අංශයේ ප්‍රධාන වගාවන් දෙක වන තේ සහ පොල් නිෂ්පාදනය ඉහළ යාමත් සමග එම අංශය වඩාත් සතුටුදායක ලෙස ක්‍රියාත්මක විය. කිලෝග්‍රෑම් දශලක්ෂ 305.7 ක වාර්තාගත නිෂ්පාදනයක් සනිටුහන් කරමින් තේ නිෂ්පාදනය, අඛණ්ඩව හය වැනි වසරෙහිදීත් ඉහළ තලයක පවත්වා ගත්තේය. මෙය 1999 වර්ෂයට වඩා සියයට 7.8 ක වර්ධනයකි. මෙය ප්‍රධාන වශයෙන් කුඩා තේ වතු හිමියන්ගේ සැපයුමෙන් නිෂ්පාදනය සියයට 11.5 කින් වැඩිවීම නිසා වූ ප්‍රතිඵලයකි. ප්‍රධාන වශයෙන් පෞද්ගලික වැවිලි සමාගම්වල පාලනය යටතේ පවතින ඉහළ සහ මැදි උස්බිම්වල තේ නිෂ්පාදනය, සියයට

3.6 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම කාලච්ඡේදයේදී වගා කළ බිම් ප්‍රමාණය නොවෙනස්ව පැවතුනු අතර සමස්ත නිෂ්පාදනයෙහි වර්ධනයට මූලික හේතුව අස්වනු ප්‍රමාණයෙහි ඉහළ යාමය. පෞද්ගලික අංශය යටතේ කළමණාකරණය වැඩිදියුණුවීම, පොහොර භාවිතය වැඩි කිරීම මෙන්ම සතුටුදායක කාලගුණික තත්ත්වයන් මෙම ඉහළ නිෂ්පාදනය සඳහා දායක විය. වර්ෂය තුළදී තේ මිල ගණන් ඉහළයාම තේ වගාව වඩාත් ලාභදායී වීම සඳහා බලපෑවේය. 2000 වසරේදී කොළඹ තේ වෙන්දේසියේ තේ වල සාමාන්‍ය මිල සියයට 17.3 කින් ඉහළ ගිය අතර කිලෝග්‍රෑමයකට රු.136.47 ක වාර්තාගත ඉහළ මිලක් හිමිවිය. කලාපයෙහි ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස රුසියාවෙන් සහ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය (CIS) රටවලින් ඇතිවූ ඉහළ ඉල්ලුම, තෙල් මිල ඉහළ යාමට සමගාමීව මැදපෙරදිග රටවලින් ඇතිවූ ඉල්ලුම, කෙන්යාවෙහි තේ ඵලදාව පහත වැටීම මෙන්ම දේශීය මුදලේ අගය අඛණ්ඩව අවප්‍රමාණය වීම යන කරුණු තේ මිල ඉහළ යාම කෙරෙහි බලපෑවේය.

දේශීය කෘෂිකර්මාන්තය සලකන කල, 1999/2000 මහ හා 2000 යල යන දෙකන්නයෙහි ඒකාබද්ධ වී නිෂ්පාදනය, මෙට්‍රික් ටොන් 28,59,000 ක් වූ අතර එය පෙර වසරට වඩා සියයට 0.3 ක ආන්තික පහත වැටීමකි. නිෂ්පාදනය පහත වැටුණු නමුත් වර්ෂය තුළ වී නිෂ්පාදන මිල ද සියයට 12 කින් අඩු විය. 1999 වර්ෂය අගදී ආනයන බදු අඩු කිරීමත් සමගම සහල් ආනයන වැඩිවීම නිසා තොග රැස්කිරීම ඉහළ යාම මෙම අංශයෙහි ලාභදායිත්වය පහත වැටීමට හේතු විය. 1996 සිට ලාභ ආනයනයන්ගෙන් ඇති වූ තියුණු තරගකාරිත්වය හේතුවෙන් ඉතා අයහපත් ලෙස පහත වැටුණු අතිරේක ආහාර භෝග කාණ්ඩයට අයත් අර්තාපල් නිෂ්පාදනය 2000 වසරේදී සියයට 79 ක වර්ධනයක් වාර්තා කළේය. ස.තො.ස. මගින් ප්‍රදානය කළ සහතික මිල සහ ආනයන බදු සියයට 80 දක්වා වැඩිකිරීමෙන් ඇතිවූ බලපෑම සේම, නොගෙවා ඇති ණය සියයට 75 ක් දක්වා කපා හැරීමට රජය ගත් තීරණයද ගොවීන් උනන්දු කරවීමට හේතු විය. කෙසේ වුවද, ලොකු ළූණු, මුං ඇට සහ මිරිස් නිෂ්පාදනය තියුණු ලෙස පහත වැටීම තුළින්, අර්තාපල් නිෂ්පාදනය විසින් ඇති කළ ධනාත්මක බලපෑම බොහෝ දුරට අඩුවූ අතර අතිරේක ආහාර භෝග අංශයේ වර්ධනය සියයට 1 කට පමණක් සීමා විය. ලොකු ළූණු සහ මිරිස් නිෂ්පාදනයෙහි පහත වැටීමට හේතුවූයේ ආනයනික නිෂ්පාදන නිසා දේශීය මිල මට්ටම පහත වැටීමයි. මේ අතර, එළවළු නිෂ්පාදනය 2000 වසර තුළදී සියයට 3.4 කින් වර්ධනය විය. පුවක්, කොකෝවා, කෝපි සහ කජු නිෂ්පාදනය පහත වැටුණු අතර, එ.ජ.ඩොලර් වටිනාකම වශයෙන් ගත් කල සුළු අපනයන භෝගයන්ගෙන් ලද විදේශ ඉපැයුම් සියයට 6 කින් පහත වැටුණි.

සත්ව පාලන අංශය 2000 වසරේදී සුළු වශයෙන් වර්ධනය විය. මෙම උප අංශයෙහි කුකුළුමස් නිෂ්පාදනය සියයට 18 ක වර්ධනයක් වාර්තා කළ අතර මේ සඳහා ඉල්ලුමෙහි ඇති වූ වැඩිවීම, පිළියෙල කළ ආහාර නිෂ්පාදන කර්මාන්තයෙහි වර්ධනය සහ අලෙවි ජාලයන් වැඩිදියුණු වීම බලපෑවේය. කෙසේ වුවද ගවමස්, ඌරුමස් වැනි අනෙකුත් මස් නිෂ්පාදනය පහත වැටුණු අතර බිත්තර නිෂ්පාදනය ද සියයට 1.5 කින් පහත වැටුණි.

## 2.3 වියදම

දේශීය ආර්ථික ක්‍රියාවලිය විසින් ජනනය කරනු ලබන සමස්ත ඉල්ලුම මනිනු ලබන්නේ ආර්ථිකයේ පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි පරිභෝජන හා ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) වියදමෙහි එකතුව වන දළ දේශීය වියදම මගිනි.

පවත්නා වෙළඳපොල මිල අනුව පරිභෝජන වියදම, රුපියල් බිලියන 1,038 වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර එය පසුගිය වසරෙහි වාර්තා වූ රුපියල් බිලියන 890 ට වඩා සියයට 16.6 ක වර්ධනයකි. සමස්ත පරිභෝජන වියදමින් සියයට 90 ක්ම පාහේ නියෝජනය වන පෞද්ගලික පරිභෝජන වියදම සියයට 14.7 ක වර්ධනයක් වාර්තා කරමින් 1999 දී තිබූ රුපියල් බිලියන 790 සිට 2000 වසරෙහිදී රුපියල් බිලියන 906 දක්වා වැඩිවිය. 1999 වසරෙහි මීට සාපේක්ෂ වර්ධන අනුපාතය සියයට 9.2 ක් විය. සමස්ත පරිභෝජන වියදම මෙසේ ඉහළ වර්ධනයක් වාර්තා කිරීමට හේතුවූයේ 2000 වර්ෂයේ ඉහළ මූර්ත ආර්ථික වෘද්ධි අනුපාතිකය හේතුවෙන් වැය කළහැකි ආදායම ඉහළයාම සහ මිල මට්ටම් සාපේක්ෂ වශයෙන් ඉහළ වර්ධනයක් පෙන්වීම යනාදී කරුණුය.

ආනයනිත භාණ්ඩ සහ සාධක නොවන සේවා මත පෞද්ගලික පාරිභෝජන වියදම, 1999 දී වූ සියයට 10 ක වර්ධනයට සාපේක්ෂව 2000 වසරෙහිදී සියයට 21 කින් ඉහළ ගියේය. ආනයනිත අයිතමයන් අතුරින් ප්‍රධාන ආහාර මත වියදම සියයට 11 කින් ඉහළ ගිය අතර, අනෙකුත් ආහාර අයිතම සහ කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ මත වියදම පසුගිය වසරට වඩා සියයට 23 කින් වර්ධනය විය. ආනයනිත ආහාර අයිතමයන් අතුරින්; තිරිඟු, ධාන්‍ය, සීනි, කිරි නිෂ්පාදන, කරවල සහ ටින්මාලු මත වියදම, ඉහළ මිල මෙන්ම පරිභෝජන ප්‍රමාණය ඉහළයාම හේතුවෙන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර සහල් ආනයනය තහනම් කිරීම හේතුවෙන් සහල් මත වියදම සැලකිය යුතු ලෙස (සියයට 90 කින්) පහත වැටුණේය. මේ අතර; මෝටර් රථ, වෛද්‍ය සහ ඖෂධ නිෂ්පාදන මත වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෝටර් වාහන මත ආනයන වියදම් ඉහළයාම කෙරෙහි, රාජ්‍ය අංශයේ සේවකයන්ගෙන් සමහර ශ්‍රේණීන් සඳහා තවදුරටත් ප්‍රදානය කෙරුණ තීරුබදු සහන යම් ප්‍රමාණයකට බලපෑවේය. මේ අතර, පසුගිය වසරේ ආන්තික වශයෙන් ඉහළ ගිය, ආනයනිත සාධක නොවන සේවා මත වියදම, සමාලෝචනයට භාජනය වන වසර තුළදී සියයට 20 කින් ඉහළ ගියේය.

ඉහළ ආර්ථික වර්ධනයක් මගින් වැය කළ හැකි ආදායම මත කෙරෙන ධනාත්මක බලපෑම පිළිබිඹු කරමින්, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන භාණ්ඩ සඳහා වන වියදම සියයට 12 කින් ඉහළ ගියේය. ආහාර වර්ග සමහරක

දේශීය නිෂ්පාදනය වර්ධනය වීම නිසාද ඇතැම් ආහාර වර්ගවල පැවති ඉහළ වෙළඳපොල මිල නිසාද ආහාර සඳහා කරන වියදම සියයට 3 කින් ඉහළ ගියේය. කාර්මික භාණ්ඩ මත වියදම, පසුගිය වසරට වඩා සියයට 17 කින් ඉහළ ගියේය. මෙම ගණයට අයත් වන; සැකසූ ආහාර, පානවර්ග, ඇඟළුම් සහ ප්ලාස්ටික් භාණ්ඩයන්හි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. මෙයට අමතරව දුරකථන සන්නිවේදන, ප්‍රවාහන, උපයෝගිතා සහ මූල්‍ය සේවා වැනි සේවා පරිභෝජනය කිරීම මත වියදම, සියයට 12 කින් ඉහළ ගියේය.

1996 ස්ථාවර මිල අනුව තක්සේරු කරන ලද, පවත්නා සම්පත් 2000 වසරේදී සියයට 9 කින් ඉහළ ගිය අතර පසුගිය වසරෙහි එහි සියයට 5.2 ක වර්ධනයක් විය. මීට හේතුවූයේ 2000 වර්ෂයේ මූර්ත වර්ධනය සහ ආනයන පරිමාව ඉහළ මට්ටමක පැවතීමයි. 2000 වසරෙහිදී ස්ථාවර පාරිභෝජන වියදම සියයට 5.2 කින් වර්ධනය වූ අතර දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 259 දක්වා සියයට 9.5 කින් වර්ධනය විය. විදේශීය සම්පත්හි දායකත්වය සියයට 33 සිට සියයට 35 දක්වා වැඩි වී ඇත.

2.3 සංඛ්‍යා සටහන
**සම්පත් සංයුතිය සහ උපයෝජනය (1996 ස්ථාවර මිල අනුව)**

| ශීර්ෂය | ප්‍රතිශතාත්මක දායකත්වය | | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|---|
| | 1998(අ) | 1999(අ) | 2000(අ) | 1999 | 2000 |
| 1. මුළු සම්පත් | 100 | 100 | 100 | 5.2 | 9.0 |
| වෙළඳ මිල අනුව ද.දේ.නි. | 67 | 67 | 65 | 4.3 | 6.0 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 33 | 33 | 35 | 7.0 | 14.9 |
| 2. උපයෝගීකරණය | 100 | 100 | 100 | 5.2 | 9.0 |
| පරිභෝජනය | 59 | 59 | 57 | 5.3 | 5.2 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 17 | 18 | 18 | 6.4 | 9.5 |
| රජය | 2 | 2 | 2 | -2.0 | 5.5 |
| පෞද්ගලික අංශය හා රජයේ සංස්ථා | 15 | 16 | 16 | 7.7 | 10.0 |
| තොග වෙනස්වීම් | 0 | 0 | 0 | -45.9 | -58.2 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 24 | 24 | 26 | 4.0 | 18.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1999 දී සියයට 18 කින් වර්ධනය වූ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 2000 වර්ෂයේදී රුපියල් බිලියන 351 දක්වා සියයට 16 කින් වර්ධනය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 77 කින් සමන්විත වන පෞද්ගලික අංශයේ ආයෝජනයන්, සියයට 18 ක වේගයකින් වර්ධනය වූ අතර, රාජ්‍ය ආයෝජනයන්හී වර්ධනය සියයට 13 ක් විය. රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ආයෝජනයන් වරාය සේවා, දුරකථන සන්නිවේදන, ගුවන් යානා, බලශක්ති, ප්‍රවාහන සහ මහාමාර්ග ඉදිකිරීම් වැනි යටිතල පහසුකම් ප්‍රසාරණ කිරීම සඳහා යොමුකොට තිබිණි.

## 2.4 පවත්නා සම්පත් සහ උපයෝජනය

දළ දේශීය නිෂ්පාදිතයෙන් හා ආනයනිත භාණ්ඩ සහ සාධක නොවන සේවාවන්ගෙන් (විදේශ සම්පත්) සමන්විත වන ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය, පවත්නා වෙළඳපොල මිල අනුව 1999 දී වූ රුපියල් බිලියන 1,584 සිට 2000 වසර තුළදී රුපියල් බිලියන 1,880 දක්වා වර්ධනය විය. මෙම රුපියල් බිලියන 296 ක වර්ධනය ජනනය කරන ලද්දේ පවත්නා වෙළඳපොල මිල අනුව දළ දේශීය නිෂ්පාදනය තුළින් ඇතිවූ රුපියල් බිලියන 150 ක වර්ධනය හා රුපියල් බිලියන 146 ක් වූ විදේශ සම්පත් වර්ධනය තුළිනි.

සමස්ත සම්පත්වලින් සිය 57ක් පරිභෝජනය සඳහාද සියයට 18 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහාද යොමු වූ අතර භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයන සඳහා යොමු වූ ප්‍රමාණය සියයට 25 ක් විය.

## 2.5 දේශීය සහ ජාතික ඉතිරිකිරීම්

දේශීය ඉතිරිකිරීම් ඇස්තමේන්තු කරනු ලබන්නේ ආයෝජනය සහ භාණ්ඩ හා භාණ්ඩ නොවන සාධක සේවා වශයෙන් නිර්වචනය කරනු ලබන විදේශ සම්පත්හි වෙනස මගිනි. දේශීය ඉතිරිකිරීම් 1999 වසරෙහිදී වූ සියයට 19.5 සාපේක්ෂව 2000 වසරෙහි දී සියයට 17.3 ක් විය. මෙය පවත්නා වෙළඳපොල මිල අනුව රුපියල් බිලියන 218 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. දේශීය ඉතිරිකිරීම් අනුපාතය පහත වැටීම, ප්‍රධාන වශයෙන් රජයේ නිර්-ඉතිරිකිරීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 සිට සියයට 3.4 දක්වා වර්ධනය වීම පිළිබිඹු කළ අතර පෞද්ගලික අංශයේ ඉතිරිකිරීම් අනුපාතය 1999 වූ සියයට 20.5 සිට 2000 වර්ෂයේදී සියයට 20.7 දක්වා සුළු වශයෙන් වර්ධනය විය.

දේශීය ඉතිරිකිරීම්, ශුද්ධ විදේශ පෞද්ගලික සංක්‍රාම සහ ශුද්ධ සාධක ආදායමෙහි එකතුව වන ජාතික ඉතිරිකිරීම් රුපියල් බිලියන 269 දක්වා ඉහළ ගිය අතර මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදේශ පෞද්ගලික සංක්‍රාම වල ඉහළයාමයි. කෙසේවුවද, දේශීය ඉතිරිකිරීම් අනුපාතිකය පහත වැටීමත් සමගම ජාතික ඉතිරිකිරීම් අනුපාතිකය (ජාතික ඉතිරිකිරීම්, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන්) 1999 වර්ෂයේදී වාර්තා වූ සියයට 23.5 සිට 2000 වසරෙහිදී සියයට 21.4 දක්වා පහත වැටුණේය. විශේෂයෙන් මැදපෙරදිග සේවය කරන ශ්‍රමිකයන්ගේ ආදායමින් සංයුක්ත වන විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාම, 2000 වසරේ ජාතික ඉතිරිකිරීම් වලින් සියයට 27 කට පමණ දායක විය.

**2.4 සංඛ්‍යා සටහන**

**ජාතික ඉතිරි කිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

රුපියල් දශ ලක්ෂ

| | 1997 | 1998(අ) | 1999(අ) | 2000(අ) |
|---|---|---|---|---|
| 1. වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය | 890,272 | 1,017,986 | 1,105,965 | 1,255,536 |
| 2. දේශීය ඉතිරිකිරීම් | 154,237 | 194,735 | 215,734 | 217,767 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදායම | -9,409 | -11,556 | -17,831 | -22,967 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 46,472 | 54,785 | 62,438 | 73,810 |
| 5. ජාතික ඉතිරිකිරීම් | 191,301 | 237,965 | 260,341 | 268,610 |
| 6. දේශීය ඉතිරිකිරීම් අනුපාතිකය (අංක 2 අංක 1 හි % ලෙස) | 17.3 | 19.1 | 19.5 | 17.7 |
| 7. **ජාතික ඉතිරිකිරීම් අනුපාතිකය (අංක 5 අංක 1 හි % ලෙස)** | 21.5 | 23.4 | 23.5 | 21.4 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව